www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපති යුද බෙර වයමින් සුනාමි සංවත්සරය සමරයි

## Sri Lankan president marks tsunami anniversary by beating the war drums

**පානිනී විජේසිරිවර්ධන විසිනි**

**2008 ජනවාරි 2**

2004 දෙසැම්බර් 26 දා කලාපයට කඩා වැදුනු භයංකර සුනාමියෙන් තුන් වසරකට පසුව 21,000කට අධික ශ්‍රී ලාංකිකයන් පිරිසක් තවමත් අපිරිසිදු කඳවුරුවල කුනු වෙමින් සිටිය දී ජනාධිපති මහින්ද රාජපක්ෂ එම සංවත්සරය යොදා ගෙන ඇත්තේ යලි ඉදිකිරීමේ කටයුතු වඩා ශීඝ්‍ර කරන බවට පොරොන්දු වීමට නොව, සිවිල් යුද්ධය යලි ඇරඹීමේ සිය ආන්ඩුවේ පිලිවෙත ආරක්ෂා කර ගැනීම පිනිස ය.

සංවත්සරය සමරනු වස්, විශාල වසයෙන් සිංහල ජනගහනයක් සහිත දකුනේ නගරයක් වන මාතර දී දෙසැම්බර් 26 දා පැවති රැස්වීමක් අමතමින්, රාජපක්ෂ අවධාරනය කලේ, "ත්‍රස්තවාදය පරාජය කිරීමේ" වැදගත්කම යි. "එල්ටීටීඊය දේශපාලන විසඳුමක් කරා තල්ලු කර ගන්න යුද ජයග්‍රහන නිශ්චිතව ම මාවත සකසන බව අපි අවබෝධ කර ගන්න ඕන. . . . අපි සුනාමි ඛේදවාචකය ජය ගත්ත වගේ ත්‍රස්තවාදී තර්ජනයට මුහුන දීල ඒකෙනුත් ඉක්මනින් ම ජය ගන්නවා."

සුනාමියේ බලපෑම "ජය ගැනීම" ගැන රාජපක්ෂ කරන සැඳහුම වංචාවකි. අඩු ගනනේ 230,000කගේ ජීවිත බිලිගෙන මිලියන 1.7කට උන්හිටි තැන් අහිමි කල ආසියානු සුනාමියෙන් වඩාත් ම හානියට ලක් වූ රටවල් අතුරින්, ඉන්දුනීසියාවට පසුව, දෙවන ස්ථානය ගත් රට ශ්‍රී ලංකාව යි. මෑත ම නිල සංඛ්‍යා ලේඛනවලට අනුව, ශ්‍රී ලාංකිකයන් 30,920කට සිය ජීවිත අහිමි වී දිවයිනේ නිවාස 117,372ක් විනාශයට හෝ හානියට ලක් වූ අතර 562,601ක් දෙනා අවතැන් විය. මෙලෙස විපතට පත්වූවන්ගෙන් බහුතරය දුප්පතුන් ය.

සාමාන්‍ය වැඩ කරන ජනතාව ඒ වන විටත් මුහුන දෙමින් සිටි පුලුල්ව පැතිරුනු ආර්ථික හා සමාජ ගැටලු ජය ගෙන නොව, සුනාමියේ බලපෑම එම ගැටලු ගැඹුරු කර ඇත. ව්‍යසනයේ තෙවන සංවත්සරයේ දී රටේ දෙමල සුලුතරයට එරෙහි යුද්ධය සම්බන්ධයෙන් රාජපක්ෂ කරන අවධාරනයේ එල්ලය වන්නේ "දේශපාලන විසඳුමක්" සොයා ගැනීම නොව, වැඩෙන ආන්ඩු-විරෝධී මනෝගතිය වර්ගෝත්තමවාදයේ අවෘත අන්තය තුලට අපසරනය කිරීම යි.

මෙහි දී ජනාධිපති යමින් සිටින්නේ බොහෝ දෙනෙක් ගොස් ඇති මාවතක ය. 1948 නිදහසේ පටන් ශ්‍රී ලංකා ධනේශ්වරය මහජනතාවගේ සමාජ ගැටලුවලට හා දුක්වේදනාවලට විසඳුමක් සම්පාදනය කිරීමෙහි ලා සිය ඓන්ද්‍රීය නොහැකියාව එලිදරව් කර ඇත. ඒ වෙනුවට, එය සිය පාලනය ස්ථාවර කර ගැනීමට උත්සාහ කර ඇත්තේ වාර්ගික භේද, ආතතීන් හා අවසානයේ 1983 දී ආරම්භ වූ භාත්‍යෘහාරක යුද්ධය අවුලුවාලීම මගිනි. සුනාමියෙන් ක්ෂනිකව ඉක්බිත්තෙහි එහි දැවැන්ත ව්‍යසනයට ලක් වූ ප්‍රදේශ තුල, සිංහල, දෙමල හා මුස්ලිම් ජනයා ජනවාර්ගික භේද කපා ගෙන එකිනෙකාට උදව් කරනු පිනිස ස්වයං-සිද්ධව ඒකාබද්ධ වූ කල, මෙම පිලිවෙත විචිත්‍ර ලෙස ප්‍රදර්ශනය විය.

පහලින් සිදු වූ මෙම සහ-ක්‍රියාකාරිත්වය දැක තැතිගැන්මට හා කම්පනයට පත් වූ පාලක ප්‍රභූවේ කොටස් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය වැනි විවිධ සිංහල අන්තවාදී කන්ඩායම් සමග එක්ව, එකමුතුවේ මෙවන් ප්‍රකාශයට පත් වීම් කඩාකප්පල් කිරීමත් ඒවාට වල කැපීමත් පිනිස සිය වර්ගවාදී උද්ඝෝෂනය වහාම උත්සන්න කලේ ය.

සිය සංවත්සර කතාවේ දී, රාජපක්ෂ මෙම සිද්ධීන්ට සැඳහුම් කලේ ය. "සුනාමිය සුලු මතභේද නොතකා සියල්ලන් ම එකට එකතු කල" බව ද ඔහු ප්‍රකාශ කලේ ය. එහෙත් "සියල්ලන්" පිලිබඳ ඔහුගේ මෙම සැඳහුම සාමාන්‍ය මහජනතාව ගැන නොව, ආන්තික දක්ෂිනාංශික පක්ෂ ගැන ය. සුනාමියට පසු කාලයේ දී, එල්ටීටීඊ-පාලිත දෙමල බහුතර ප්‍රදේශවලට සුනාමි ආධාර බෙදීමට විරුද්ධ වූ ජවිපෙ හා හෙල උරුමය සමග රාජපක්ෂ පෙල ගැසුනේ ය. සුනාමිය එල්ටීටීඊය දුර්වල කර ඇති බවත් එය "විනාශ කරනු" පිනිස යුද්ධය යලි ඇරඹීමට දැන් කාලය බවත් ඔවුහු තර්ක කලහ.

එල්ටීටීඊය සමග 2002 පෙබරවාරියේ දී අත්සන් කෙරුනු සටන් විරාම ගිවිසුම "යලි සලකා බලන" බවට ඔහු පොරොන්දු වීමෙන් පසුව ජවිපෙන් හා හෙල උරුමයෙන් ඔහුට ලැබුනු සහයෝගය ඇතිව රාජපක්ෂ 2005 නොවැම්බර් ජනාධිපතිවරනය ජයගත්තේ කුඩා බහුතරයකිනි. එල්ටීටීඊය සමග ආතතීන් වර්ධනය

වීමෙන් අනතුරුව, පසුගිය ජුලි මස දී, රාජපක්ෂ සටන් විරාම ගිවිසුම විවෘතව උල්ලංඝනය කරමින්, නැගෙනහිර පලාතේ මිලිටරි ආක්‍රමනික මෙහෙයුම් යලි අරඹන ලෙස නියෝග කලේ ය. එතැන් පටන් මිලිටරිය එල්ටීටීඊ-පාලිත ප්‍රදේශ ගනනාවක් ම සියතට ගෙන තිබේ. යුද්ධය යලි ඇරඹීමේ ඔහුගේ පිලිවෙත, එක්සත් ජනපදය ඇතුලු මහ බලවතුන් විසින් දිරිගන්වනු ලැබ තිබේ. ඔහු සිය කතාවේ දී පුරසාරම් දෙඩූ පරිදි, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගෙන යන්නේ "ජාත්‍යන්තර ප්‍රජාවගේ ආශිර්වාදය ඇතිව" ය.

රාජපක්ෂ යටතේ, පසුගිය දෙවසර තුල දී, ආන්ඩුව ආරක්ෂක වැය ශීර්ෂය සියයට 265කින් ඉහල දැමී ය. 2008 වසර සඳහා යුද වියදම් රුපියල් බිලියන 166ක (එ.ජ. ඩොලර් බිලියන 1.5) වාර්තාගත අගයක් දක්වා තවත් සියයට 20කින් ඉහල දමා ඇත.

යුද වියදම්වල මෙම දැවැන්ත වැඩි වීමේ බර, ජීවන මට්ටම්වලට එරෙහි ප්‍රහාරයන්ගේ රූපයෙන් සාමාන්‍ය ජනතාවගේ කර මත ඍජුව ම කඩා පාත් කරනු ලැබ තිබේ. එයට ප්‍රතිචාර වසයෙන්, කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා ශිෂ්‍යයන්ගේ අරගල රැල්ලක් පැන නැගී ඇත. ඔක්තෝබර් 31 දා රාජ්‍ය අංශයේ 200,000ක් පමන සිංහල, දෙමල හා මුස්ලිම් ගුරුවරු, වැටුප් වැඩි කරන ලෙස ඉල්ලමින් දීප-ව්‍යාප්ත වර්ජනයක නිරත වූ අතර නොවැම්බරයේ දී හා දෙසැම්බර් මුල දී විශ්වවිද්‍යාල සිසුන්ගේ විරෝධතා පෙලපාලිවලට පොලීසිය මෘග ලෙස පහර දුනි.

මෙවන් අරගලවලට සම්බන්ධ වන අය "සිංහල කොටි" (එල්ටීටීඊයේ සිංහල ආධාරකරුවන්) හෝ "මව්බිමට ද්‍රෝහිවන්නන්" ලෙස රාජපක්ෂ සහ ඔහුගේ සගයන් විසින් නිරතුරුව ම හංවඩු ගසනු ලැබේ. ඒ සරනගත කඳවුරුවල හා අලුතෙන් සාදන ලද ප්‍රමිතියෙන් තොර නිවහන්වල වෙසෙන කෝපාවිෂ්ට සුනාමි සරනගතයන් ඇතුලු සෙසු අය සිය කොන්දේසි සම්බන්ධයෙන් විරෝධතා දැක්වීම වලකාලනු වස් ඔවුන් බියගැන්වීම පිනිස ය.

යුද්ධය යලි ඇරඹීම, ජීවිත 5,000කට වඩා බිලිගෙන, සුනාමියෙන් විපතට පත් ජනයාගෙන් අති මහත් බහුතරය වෙසෙන නැගෙනහිර හා උතුරු පලාත්වල එම ජනයා ඇතුලු තවත් 250,000ක් අවතැන්ගත කොට ඇත. රටේ දකුනේ විසූ සුනාමියෙන් විපතට පත් ජනයාගෙන් බොහෝ දෙනෙක් තවමත් දුෂ්කරතාවලට මුහුන දෙන අතර ම, නැගෙනහිර හා උතුරේ එම ජනයා මුහුන දෙන තත්වය වඩා දරුනු ය.

යුද්ධයෙන් විනාශයට පත් වූ නැගෙනහිර පලාතේ දිස්ත්‍රික්කයක් වන අම්පාරේ සුනාමියෙන් විපතට පත් ජනයා වෙසෙන කඳවුරු 58ක් තවමත් පවතින බව, දෙසැම්බර් 24 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යංශයේ ලේකම් ඩබ්ලිව්.කේ.කේ. කුමාරසිරි පිලිගත්තේ ය. නැගෙනහිර පලාතේ වෙසෙන සුනාමියෙන් විපතට පත් ඉතිරි ජනයා මඩකලපුව හා ත්‍රිකුනාමලය දිස්ත්‍රික්කවල පිහිටි කඳවුරු තුල යුද සරගතයන් සමග එකට ජීවත් වෙයි.

එල්ටීටීඊ-පාලිත වන්නි ප්‍රදේශය තුල තත්වය විශේෂයෙන් ම දරුනු ය. ආන්ඩුවේ යලි ගොඩනැගීමේ හා සංවර්ධන ඒජන්සියට (ආර්ඒඩීඒ -- රාඩා) අනුව, 2007 ඔක්තෝබර් වන විට උතුරේ නිවාස ව්‍යාපෘතිවලින් සම්පූර්න වී තිබුනේ සියයට 39ක් පමනි.

මෙම නිල සංඛ්‍යා ලේඛනවල නිරවද්‍යතාව ස්වාධීන සංවිධාන විසින් අභියෝගට ලක් කරනු ලැබ ඇත. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ඔෆ් ශ්‍රී ලංකා (ටීඅයිඑස්එල්) සංවිධානය විසින් මෑත දී නිකුත් කරන ලද ප්‍රකාශයක් මෙසේ කියා සිටී: "රටේ නැගෙනහිර පලාතේ නිවාසවල තියුනු හිඟයක් පවතී. නිදසුනක් ලෙස, මුතූර්හි විනාශ වූ නිවාස 1.249ක් වෙනුවෙන්. දානපතියන්ගේ ආධාරවලින් හා අයිතිකරුගේ ම වියදමින් ඉදිකෙරෙන නිවාස ව්‍යාපෘති මගින් සම්පූර්න කර ඇත්තේ නිවාස 422ක් පමනි." ටීඅයිඑස්එල් "ආන්ඩුවේ සංඛ්‍යා ලේඛන බිම් මට්ටමේ යථාර්ථයන් සම්බන්ධයෙන් නොමග යවන චිත්‍රයක් නියෝජනය කරන" බවට අවධාරනය කරමින්, "උතුරේ හා නැගෙනහිර විපතට පත් ප්‍රජාවන්ගේ නිවාස අයිතිය සහතික කරන ලෙසත් එයට ගරු කරන ලෙසත්" ආන්ඩුවෙන් ඉල්ලා සිටී.

කුමාරසිරිට අනුව, දකුනේ, මාතර සුනාමි සරනගත කඳවුරු හතරක් ද ගාල්ලේ එවන් කඳවුරු තුනක් ද තවමත් පවතින අතර, දිවයිනේ අගනුවර වන කොලඹ ප්‍රදේශයේ කඳවුරු 12ක් පවතී. පවුල් 4,000කට වැඩි සංඛ්‍යාවක් සිය නිවාස ගැටලුවලට විසඳුමක් බලාපොරොත්තුවෙන් ඒවායේ කල් ගෙවති.

මෙම කඳවුරුවල තත්වය අතිශයින් ශෝචනීය ය. ඒවායේ ගොඩනැගිලිවලින් බොහොමයක බිත්ති ටකරන් තහඩුවලින් තනා ඇති අතර අතු සෙවිලි කරන ලද වහලවල් තුලින් වැසි දිය කාන්දු වේ. වැසිකිලිවල හිඟයක් පවතින අතර තිබෙන ඒවා ද වැසි කාලවල දී සාමාන්‍යයෙන් පිටාර ගලයි.

නව ජනාවාසවලින් බොහොමයකට මාර්ගවලට ප්‍රවිෂ්ටය, ජලය, විදුලිය හා මූලික සෞඛ්‍ය සේවාවන් නොමැති හෙයින් ශ්‍රී ලංකාවේ සුනාමි නිවාස ව්‍යාපෘති "සම්පූර්න වී ඇතැයි සැලකිය නොහැකි" යැයි ජාත්‍යන්තර කම්කරු සංවිධානය (අයිඑල්ඕ) ප්‍රකාශ කලේ ය. නව නිවාස ලැබුනු ජනයා ඉදිකිරීමේ ප්‍රමිතීන් සම්බන්ධයෙන් පොදුවේ අපේක්ෂාභංගත්වයට පත්ව ඇත. නිසි සැලසුමකින් තොරව සිදු කරන ලද ස්ථිර නිවාස හා බෝට්ටු තැනීම, සාමාන්‍යයෙන් අධීක්ෂනයට ලක් නොවුනු අතර ප්‍රමිතියෙන් පහල මට්ටමේ පවතී.

ටීඅයිඑස්එල් ප්‍රකාශය මෙසේ සටහන් කරයි:" අලුතෙන් තනන ලද නිවාසවල වැසියන් අතර -- විශේෂයෙන් ම දකුනේ -- අසන්තෘප්තියේ සාමාන්‍ය මට්ටමක් පොදුවේ පවතී. ගුනාත්මක භාවයෙන් අඩු නිවාස හෝ සංස්කෘතිමයව හා පාරිසරිකව අසංවේදී ඉදිකිරීම් නිවාසවල සෞඛ්‍ය සම්පන්න වාසයට අභියෝග කරන තත්ත් දී මෙම අසන්තෘප්තිය බොහෝ අවස්ථාවල දී බෙහෙවින් දක්නට ලැබේ."

ධීවරයන්ගේ ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරයේ ප්‍රමුඛයකු වන හර්මන් කුමාර මාධ්‍යවලට මෙසේ පැවසී ය. "මෑත දී අප කල සමීක්ෂනයක දී අපට දැනගන්ට ලැබුනේ නව නිවාසවල බිත්ති දැනටමත් ඉරිතලා ඇති අතර වහල හා බිත්ති අතර පරතරයක් පවතින බව යි. " ලබා දී ඇති බෝට්ටු ප්‍රමිතියෙන් තොරව නිපදවීම හේතු කොට ගෙන ඒවා මුහුදු යාම සඳහා යොදා ගත නොහැකි බවට ද ඔහුගේ සංවිධානය පැමිනිලි කර තිබේ. පාසල් යලි ගොඩනැගීම -- විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර පලාත්වල -- තවමත් සම්පූර්න කල යුතුව තිබේ. සන්ඩේ ටයිම්ස් පත්‍රයේ දෙසැම්බර් 23 දා පල වූ වාර්තාවකට අනුව, විනාශයට පත් වු පාසල් 183කින් යලි ගොඩනගා ඇත්තේ 100ක් පමනක් යැයි සුනාමි අධ්‍යාපන පුනරුත්ථාපන නිරීක්ෂක ආයතනයේ (ටීජ්ආර්එම්) නිලධාරියෙක් පිලිගෙන ඇත. පාසල් 40ක වැඩ තවමත් ඇත්තේ අඩක් නිමකරන ලද තත්වයේ ය.

දිවයිනේ උතුරේ හා නැගෙනහිර යාපනය, මුලතිව්, කිලිනොච්චි, ත්‍රිකුනාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල පාසල් 40ක් යලි ගොඩනැගීම අත්හිටුවා ඇත්තේ යුද්ධය හේතු කොට ගෙන ය. දෙසැම්බර් 27 දා රජය සතු ඩේලි නිව්ස් පත්‍රය අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්ත මෙසේ පවසන ලදැයි උපුටා දක්වා තිබේ: "මෙම පාසල් උතුරේ හා නැගෙනහිර පිහිටි නිසා අපට ආරක්ෂක හමුදාවන්ගේ අනුමැතිය ලැබෙන තෙක් බලා සිටීමට ආන්ඩුවට සිදුව තිබේ."

යලි ගොඩනැගීමේ ව්‍යාපෘතිවලින් බොහොමයකට ම මේ වන තෙක් මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත්තේ ආන්ඩු නොවන සංවිධාන හෝ විදේශ ආන්ඩු ය. කෙසේ වෙතත්, සුනාමියෙන් පසුව විදේශ දානපතියන් පොරොන්දු වූ එ.ජ. ඩොලර් බිලියන 3.1ක මුදල්වලින් ලබා දී ඇත්තේ ඩොලර් බිලියන 1.7ක් පමනි, එනම්, එයින් හරි අඩකට යන්තම් වැඩ ප්‍රමානයක් පමනි.

රාජපක්ෂ සිය සංවත්සර කතාව යොදා ගත්තේ, 2005 නොවැම්බරයේ දී ඔහු දුන් පොරොන්දුව --- එනම්. නිවාස හිඟය "මාස හයකින්" විසඳීම -- බිඳ දමා ඇත්තේ ඇයි ද යන්න විමසා බැලීමට නොව යුද බෙර ඊටත් වඩා සෝෂාකාරීව වැයීමට ය යන කාරනාව මගින් සුපැහැදිලි වන්නේ ව්‍යසනයෙන් වසර තුනකට පසුව සුනාමියෙන් විපතට පත් ජනයා තවමත් මුහුන දෙන භයංකර කොන්දේසිවලට අවධානය යොමු කිරීමේ මොන ම අභිප්‍රායක් වත් ඔහුගේ ආන්ඩුවට නොමැති බව යි.

ශ්‍රී ලංකාවේ කම්කරුවන්. ගොවීන් හා ශිෂ්‍යයන් මුහුන දෙන අති මූලික සමාජ ගැටලු විසඳලීමට නම්, උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදා වහා ම ඉවත් කිරීම, යුද්ධය අවසන් කිරීම හා අව්‍යාජ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී මූලධර්මවල පදනම මත සමාජය ඉහල සිට පහල යලි ගොඩනැගීම එල්ල කර ගත් කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම අවශ්‍ය ය.